(පි.ජ.එෆ්/87)

# ගිවිසුම් පත්‍රය

මූල්‍ය ප්‍රභවය :- ..................................................................................................

කර්මාන්තයේ නම :- ..................................................................................................

..................................................................................................

මෙහි පහත අත්සන් කරන (ලිපිනය) ..................................................................

.................................................................................................. හි පදිංචි (නම) ලේකම්/සභාපති වන (මොහු මින්පසු කොන්ත්‍රාත්කරු) යනුවෙන් හැඳින්වෙන අතර ඊට උරුම ඔහුගේ උරුමක්කාරයෝද පොල්මක්කාරයෝද අත්මිනිස්ත්‍රාත්කාරයෝද ඇතුලත් වෙති.

ඌව පළාත් සභාවේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වන / ප්‍රාදේශීය ලේකම්ගේ බලය පවරන ලද නිලධාරියා වන ..................................................................

මහතා සමග, මොහු මින්පසු ප්‍රාදේශීය ලේකම්ගේ බලය පවරන ලද නිලධාරි යනුවෙන් හැඳින්වෙන අතර, එයින් පූර්වෝක්ත .................................................................. මහතාද (ඔහුගේ නිල අනුප්‍රාප්තිකයෝද අදහස් කෙරෙති. එසේම ඔහු ඊට ඇතුලත් වෙති.) ගිවිසගෙන මෙහි පාර්ශවකාරයින් විසින් අත්සන්කොට දිනය යොදා ඇති සැලසුම්/ඇස්තමේන්තු/වැඩ විස්තර/පත්‍රිකා ගාස්තු උපලේඛනයෙහි (මේවා මින් පසු වැඩ විස්තර පත්‍රිකාව ලෙස හැඳින්වෙන අතර) දන්වා ඇති වැඩ රුපියල් .................................................................. ..................................................................(රු..........................................)කට හෝ පහත සඳහන් වන කොන්දේසිවලටත් වැඩ කරන අතර ප්‍රාදේශීය ලේකම්ට හෝ එම වැඩය පරිපාලනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් නිසියාකාරයෙන් බලය පවරනු ලැබූ හෝ අවශ්‍ය වෙතැයි හැගෙන කොන්දේසිවලට හා අඩු කිරීම් වලට යටත්ව මැනීම හෝ තක්සේරු කිරීම අනුව කොන්ත්‍රාත්තුවෙකුට අයවිය යුතු වෙනත් මුදලකට හෝ භාර දීමට කොන්ත්‍රාත්කරු මෙයින් පොරොන්දු වන්නේය.

තවද මේ කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අයවිය යුතු වුවද මා ගෙවිය යුතු වූද මුදල් ගෙවන බවට ඇපවීමක් වශයෙන් එකී කොන්ත්‍රාත්කරුවූ (සම්පූර්ණ නම) ..................... .................................................................. නැමැති මම මේ කොන්ත්‍රාත්තුවේ ඇප මුදල ලෙස 20................................ මස .................. දින ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කරන්නට යෙදුනු (ඇස්තමේන්තුවේ/ටෙන්ඩරයේ 5% ක මුදල රුපියල් ............................ (රු. ............................................) ක් වූ මුදලට එකී ප්‍රාදේශීය ලේකම් වෙත උකස් කොට යටත් කොට තබා පවරා දෙමි.

**<u>* කොන්දේසි :</u>**

01. ප්‍රාදේශීය ලේකම්ගේ සම්පූර්ණ තෘප්තියට හේතු වන පරිද්දෙන් සහ (හෝ) ප්‍රාදේශීය ලේකම් විසින් එහි වැඩ අධීක්ෂණය කොට වාර්තා කිරීම සඳහා නිසියාකාරයෙන් බලය පවරනු ලැබූ නිලධාරියාගේ සම්පූර්ණ තෘප්තියට හේතුවන පරිද්දෙන් නිසිලෙසට ද එය කල යුතු වන්නේය.මෙම වැඩය වැඩ පරීක්ෂක විසින් සැලසුම් කොට පිළියෙල කළ යුතුය.එසේ නැතහොත් වැඩ පිළිබඳව උපදෙස් නිකුත් කරන්නන් එය පරිපාලනය කරන්නාත් ප්‍රාදේශීය ලේකම් විසින් මෙම වැඩය සැලසුම් කොට පිළියෙල කල යුතුය.

02. මෙම ගිවිසුම් අත්සන් කරන දින සිට මාස/දින ......................... ක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් ඉහත සඳහන් කරන පරිදි පත්කල නිලධාරියාට හෝ වැඩය නිම නිම කොට භාරදිය යුතුය.එතකුදු වුවත් සෑහෙන හේතු ඉදිරිපත් කලහොත් එකී කාල පරිච්ඡේදය ද දීර්ඝ කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත.



CamScanner

03. එකී කාල පරිච්ඡේදය නොහොත් දීර්ඝ කාල පරිච්ඡේදය ඇතුලත දී එම වැඩය නිම කොට භාරදීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් වැඩය නිමකොට භාර දීමට ප්‍රමාද වන එක් එක් සතියක හෝ සතියේ කොටසක් හෝ එක් එක් දිනයක් වෙනුවෙන් ප්‍රමාද කාල අලාභ වශයෙන් රුපියල් ..........................................................................................................................
(රු. ..............................)ක මුදලක් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය ලේකම්ට ගෙවිය යුතු වන්නේය.

04. කොන්ත්‍රාත්කරු විසින් මෙම වැඩය සෑහෙන පමණ ඉක්මනින් කරගෙන නොගියහොත් හෝ එය සතුටුදායක ලෙස නොකලහොත් මෙම ගිවිසුම අවලංගු කරන බවට කල් ඇතිව ලියවිල්ලක දැන්වීමක් කොට ඕනෑම වේලාවක මෙම ගිවිසුම අවලංගු කිරීමට කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත්තේය. එවැනි අවලංගු කිරීමක් හේතුකොට ගෙන ප්‍රාදේශීය ලේකම්ගෙන් යම් වන්දියක් ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට අයිතිවාසිකම් නැත්තේය. එසේවුද වුවත් මෙම ගිවිසුමේ වගන්ති යටතේ තමාට ලැබිය යුතු ප්‍රමාද කාල අලාභ හෝ මුදලක් අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට ඇති අයිතිවාසිකමට කිසිදු බාධාවක් නැත්තේය.

05. කොන්ත්‍රාත්කරු මෙම වැඩය සෑහෙන පමණ ඉක්මනින් කරගෙන නොයන බවට හෝ මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව වැඩ නොකරන බවට හෝ නැතහොත් සම්පූර්ණ කර නැති බවට හෝ සංවර්ධන වැඩ අධිකාරි,වැඩපරිපාලක හෝ වැඩය පරිපාලනයකොට ඒ පිළිබඳව වාර්තා කිරීමට කිරීමට ප්‍රාදේශීය ලේකම්ගෙන් නිසිපරිදි බලය ලත් නිලධාරි හෝ වෙනයම් නිලධාරියකු හෝ විසින් අත්සන් කර දෙන සහතිකයක් නොහොත් වාර්තාවක් වූ කලී එය පිළිබඳ  අවසාන වූද කොන්ත්‍රාත්කරු බැඳ තබන්නාවූද සහතිකය නොහොත් වාර්තාව වන්නේය.

06. වැඩය කොතෙක් දුරට නිම කර තිබේදැයි බලන දිනය වන විට සැබැවින්ම සම්පූර්ණ කොට ඇති වැඩ ප්‍රමාණය දළ වශයෙන් වටහාගෙන මුදලින් ගණනින් සියයට (100%) ........................ ක් වැඩය කරගෙන යන අතර කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුයි.සුදුසුයැයි තමාට වැටහෙනවිට යම් යම් විභාග කිරීමෙන් පසු මෙම සියලුම ගෙවීම් ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවිය යුතුය.වැඩය සතුටුදායක ලෙස නිම වනතුරු ඉතිරි මුදල තබාගෙන මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම්වලදී කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු යම් මුදල් එයින් අඩුකර ඉතිරි වන මුදල කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුය.

07. වැඩය නිම කොට භාරදී මාස ................ (.............) ක් ගතවනතුරු ඇපතැන්පත් මුදල/ රඳවාගත් මුදල (කර්මාන්තයේ වටිනාකමින් (10%) සියයට දහයක්) තබාගත යුතුය. එම කාල පරිච්ඡේදය ඇතුලත එම වැඩයේ යම් අඩුලුහුඩුකමක් දක්නට ලැබුනහොත් එම අඩුලුහුඩුකම් සම්පූර්ණ කොට දිය යුතුය.

08. මෙහි පස්වන වගන්තිය යටතේ මෙම ගිවිසුම අවලංගු කරනු ලැබුවහොත් මෙම වැඩය හෝ ඉන් කොටසක් හෝ කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙන අයකු ලවා කරවාගැනීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත්තේය.එම වැඩය හෝ එම වැඩ කොටස වෙන අයකු ලවා කරවාගැනීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත්තේය.එම වැඩය හෝ එම වැඩ කොටස වෙන අයෙකු ලවා කරවා ගැනීමේදි මෙම ගිවිසුම් යටතේ ඉන් එම වැඩය හෝ එම වැඩය වැඩ කොටස කොන්ත්‍රාත්කරුම කලේ නම් ඔහුට ගෙවිය යුතු මුදලට වැඩිපුර වශයෙන් දරන්නට වූ වියදම්ද එම කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය ලේකම්ට ගෙවිය යුතුය.මේ මුදලට මෙකී 4 වන වගන්තිය යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවන්නට බැඳී සිටින එම අලාභයට අතිරික්ත වශයෙන් ගෙවිය යුතු මුදලකි.තවද එසේ වැඩිපුර දරන්නට වූ සිදුවූ වියදම් සම්පූර්ණයෙන් හෝ ඒ වියදමින් කොටසක් හෝ බේරා ගැනීම පිණිස 7 වැනි වගන්තිය යටතේ අත්හිටුවා ගත් මුදලින් හෝ ඇප වශයෙන් කොන්ත්‍රාත්කරු තැන්පත් කර තිබෙන මුදලින් හෝ ඕනෑම මුදලක් ගණන් ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත.

09. කොන්ත්‍රාත්කරු ඕනෑම සේවකයකු විසින් නොහොත් වෙනුවෙන් ඒ ස්ථානයේම සිට කෙළින්ම එම වැඩය පරිපාලන කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් වැඩය ගෙන ඇති ඕනෑම සේවකයකු විසින් නොහොත් වෙන් වෙන්වද කම්කරු ආඥා පනත (1-7 වන පරිච්ඡේදය) යටතේ ද කරන කවර ඉල්ලීමක් වුවද කොන්ත්‍රාත්කරු ප්‍රාදේශීය ලේකම් නිදහස් කල යුතුය.වැඩය කරගෙන යන අතර කම්කරුවන්ගේද මහජනයාගේද ආරක්ෂාව සැලසීම පිණිස අවශ්‍ය සියලුම අනතුරු



CS CamScanner

දක්වන නිවේදන හා කොඩිපතක් ආදිය කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු අතර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

තවද වැඩය පරිපාලනය කොට ඒ ගැන වාර්තා කිරීමද ඉහත සඳහන් පරිදි විධිප්‍රකාර පත් කරන නිලධාරියාගේ සියලුම සේවකයින්ට තම වැඩපලට ඇතුලත් වීම කොන්ත්‍රාත්කරු විසින් ඉඩ දී ඔවුන්ට අවශ්‍ය සියලු උපකරණ ආදිය සපයා අවශ්‍ය සෑම උපකාරයක්ම කළ යුතුය.

10. මෙම කෝන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු වන්දි මුදලක් හෝ අලාභයක් හෝ වෙනයම් ඕනෑම ගණනක් සම්පූර්ණයෙන් බෙරාගැනීම පිණිස හෝ බදු මුදල් ගණනින් කොටසක් බෙරාගැනීම පිණිස මෙම ගිවිසුම යටතේ මොනයම් ආකාරයකට හෝ ප්‍රාදේශීය ලේකම්ගෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව තිබෙන කවර මුදලක් වුවද ගවීමට ද නැතහොත් එසේ ගෙවිය යුතු මුදලක් නිසි මාර්ගයෙන් අයකර ගැනීමටද ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත්තේය. තවද මෙම කර්මාන්තයේ අවසන් බිල්පත ගෙවා අවසන් වූ පසුව වුවද, බිල්පත ගෙවන අවස්ථාවේ තිරීක්ෂණය නොවූ යම් අඩුපාඩුවක් හෝ වැරදි ගණනය කිරීමක් හෝ වැරදි ඇස්තමේන්තු කිරීමක් නිසා හෝ වැඩිපුර ගෙවීමක් කර ඇති විටක දී එම මුදල අතරුදවුමෙන් අඩුකර ගැනීමට දෙපාර්ශයම එකඟ වේ.යම් හෙයකින් එසේ වැඩිපුර ගෙවා ඇති මුදල අතරුදවුම් මුදල ඉක්මවා යන අවස්ථාවක දී එසේ ගෙවූ වැඩිපුර මුදල රජයට ආපසු ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටිනු ඇත.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ලබන වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ලාංකික කම්කරුවන්ට පමණක් ගෙවිය යුතුය.කොන්ත්‍රාත්තුවේ මෙම කොන්දේසි කවර අන්දමින් හෝ කොන්ත්‍රාත්කරු විසින් කඩකලහොත්, මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කළ හැකිය.එතකුදු වුවත්,ඉතාමත් විශේෂ අවස්ථාවකදී පමණක් කල් ඇතිව ලියවිල්ලකින් තමා අනුමත කරන ලාංකික නොවූ යම් යම් කම්කරුවන්ගෙන් වැඩ ගැනීමට ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත්කරුට ඉඩ දෙන්නට පුළුවන. එසේ ලියවිල්ලකින් ලත් අනුමැතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන්ගෙන් වැඩ ගැනීමට තහනම්ය.ලාංකික යන වචනයෙන් අදහස් කරන්නේත්,ඊට ඇතුලත් වන්නේත් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් වූ අය පමණි.

12. වැඩය පරිපාලනය කිරීමට කොන්ත්‍රාත්කරු විසින් පත්කරනු ලැබූ යම් අයෙකු ගැන හෝ කොන්ත්‍රාත්කරු වැඩට ගෙන සිටින යම් තැනැත්තන් ගැන ප්‍රාදේශීය ලේකම් හෝ එකී වැඩය පරිපාලනය කොට ඒ ගැන වාර්තා කිරීමට ඉහත සඳහන් පරිදි විධි වූ ප්‍රකාරවත් පත් කරන ලද නිලධාරීන් විරුද්ධ වන්නේ නම් කොන්ත්‍රාත්කරු විසින් එකී තැනැත්තන් අස්කළ යුතුය. එම යම් තැනැත්තෙකු නොහොත් තැනැත්තන් අස් කරන ලෙස තමා ඉල්ලන්නේ මක් නිසාද යන වග ප්‍රකාශ කිරීමට ප්‍රාදේශීය ලේකම් හෝ එකී වැඩය පරිපාලනය කොට වාර්තා කිරීමට ඉහත සඳහන් පරිදි විධිප්‍රකාර පත්කල නිලධාරියා බැඳී නැත්තේය.

13. මෙම කොන්ත්‍රාත්තුව කරගෙන යන කාලය තුලදී මේ වැඩය නිසාම හෝ මේ වැඩ සම්බන්ධයෙන් නොවූවද, කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතුව තිබෙන යම්කිසි ණයක් අයකර ගැනීම පිණිස කොන්ත්‍රාත්කරුට ගෙවන්නට තිබෙන මුදලක් නොගෙවන ලෙස ඉල්ලා පිස්කල් ගෙන් ප්‍රාදේශීය ලේකම්ට දැන්වීමක් ලැබුන හොත්,එම දැන්වීමත් සමග වහාම මෙම ගිවිසුම නිෂ්ප්‍රභා වී අවසාන වේ.එසේම කොන්ත්‍රාත්කරුට ගෙවන්නට එම වැඩය වහාම අස්කරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට බලය බලය ඇත්තේය.තවද කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවිය යුත්තේ කොන්ත්‍රාත්කරු එසේ අවසන් කරන දිනය වන විට ඇත්තවශයෙන්ම කර තිබෙන වැඩ වෙන් වෙන්ව එකී වැඩ පරිපාලනය කොට ඒ ගැන වාර්තා කිරීමට ඉහත සඳහන් පරිදි විධිවූ ප්‍රකාර පත්කල නිලධාරියා තක්සේරු කල මුදලින් පූර්වෝක්ත වගන්ති යටතේ දඩ වශයෙන් හෝ ප්‍රමාණ කාල අලාභ හෝ අයවිය යුතුව තිබෙන යම් මුදලක් ඇතොත් ඒ මුදලද පිස්කල් මේ මුදල ඉල්ලා තිබෙ නම් ඒ මුදල්ද අඩුකොට ඉතිරිවන මුදල් පමණි.

14. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන කාලය තුලදී යම්කිසි කාරණයක් නිසා එකී වැඩය පිළිබඳ වැඩ විස්තර පත්‍රිකාව හා සැලසුම් වෙනස් කිරීම සුදුසුයැයි තමාට හැඟී යන්නේ නම ප්‍රාදේශීය ලේකම් විසින් තමාගේ තනි කැමැත්ත පිට ඒවා වෙනස් කළ හැකිය.තවද වැඩය කරගෙන යන අතර,එම වැඩය පිළිබඳව වැඩ විස්තර පත්‍රිකාවට ඇතුලත් කොට නැති වැඩ සඳහා සෑහෙන මිල ගණන් නියම කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත්තේය.